ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2023-01-10

පැමිණිලි පාර්ශවය : යූ.ඩබ්. සෙනෙවිරත්න මයා.
නො 48/07, දෙවන පටුමග,
සන්සයිඩ් ගාර්ඩන්ස්,
කරාපිටිය.

වගඋත්තරපාර්ශවය : සභාපති,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
1200/9, රජමල්වත්ත,
බත්තරමුල්ල.

පැමිණිලි අංකය : HRC/187/22

**පැමිණිල්ල :-**

පැමිණිලිකරු ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරේ සිට සහකාර පොලිස් අධිකාරී තනතුරට පත් කිරීමේ සියළු සුදුසුකම් සපුරා තිබියදී ඒ සඳහා ඉල්ලුම් කර තිබී ඇති අතර, ඒ අනුව වගඋත්තරකරුවන් විසින් මූලික සුදුසුකම් නොමැති බවට දන්වා අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමෙන් පැමිණිලිකරුට අසමාන ලෙස සැලකීමෙන් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) ව්‍යවස්ථාව උල්ලංඝනය වී ඇති බවට දක්වා ඇත. සහකාර පොලිස් අධිකාරී තනතුරට අදාළ පුරප්පාඩු පිරවීම සඳහා ජ්‍යෙෂ්ඨතාවය සහ කුසලතාවය යන පදනම මත සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2020.12.30 දිනැති අංක :පීඑස්සී/ජ්පීපී/8/8/57/20 දරණ ලිපිය මගින් අනුමැතිය ලබාදී තිබී ඇත. ඒ අනුව සහකාර පොලිස් අධිකාරී තනතුරට අදාලව පැමිණිලිකරු හට සියළු සුදුසුකම් සපුරා තිබීම මත අයදුම්පතක් ඉදිරිපත් කර ඇති බවත්, අවස්ථා කිහිපයකදී අයදුම්පත් කැඳවීමේ දිනය සංශෝධනය වී ඇති අතර අවසන් වරට අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2022.09.02 දින ලෙස සඳහන්ව ඇති බවත් දක්වා ඇත. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පෙර සුදුසුකම් සපුරා තිබියයුතු බවට සඳහන්ව තිබෙන අතර, පැමිණිලිකරු ඒ අනුව සහකාර පොලිස් අධිකාරී තනතුරට නියමිත දිනට පෙර අයදුම් කර තිබී ඇත. පැමිණිලිකරුට එරෙහිව 2015.04.28 දින කුච්චවේලි පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ලෙස සිටියදී කරන ලද විනය කඩ කිරීමක් සම්බන්ධව චෝදනා පත්‍රයක් නිකුත් කර තිබී ඇති අතර, එකී චෝදනාපත්‍රයට වැරදිකරු කොට වැටුප් වර්ධකයක් විලම්භනය කර



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office : 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson : 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax : 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail : sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone : 94 -11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary : 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline : 1996
වෙබ් / இணையம் / Web : www.hrcsl.lk

ඇති බව පැමිණිලිකරු දක්වා ඇත. චෝදනා පත්‍රය නිකුත් කර ඇත්තේ 2011.11.25 දින බව ද පැමිණිලිකරු විනය නියෝගයට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත විනය නියෝග ප්‍රතිශෝධනයක් සඳහා අයදුම් කර ඇති බව ද දක්වා ඇත. කෙසේ වුවද වරද සිදු කළ බව කියන 2015.04.28 දින සිට ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරේ සිට සහකාර පොලිස් අධිකාරී තනතුරට උසස් කිරීමේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් අයදුම්පත් කැඳවූ ලිපියට අනුව අවසන් දිනය වන 2021.09.02 දිනට පැමිණිලිකරුගේ සතුටුදායක සේවා කාලය වසර 06ක් පමණ වුවද බඳවා ගැනීමට සුදුසුකම් ලෙස වසර 03ක සතුටුදායක සේවා කාලයක් ඉල්ලා තිබියදී තම අයදුම්පත නිශ්ප්‍රභ කිරීම නීතියට පටහැනි බව පැමිණිල්ලෙන් පෙන්වා දී ඇත.

**වගඋත්තකරකරුවන්ගේ කරුණු දැක්වීම :-**

වගඋත්තරකරුවන් තම වාර්තාව 2022.08.30 දින තම අංක : පීඑස්සී/ඒපීපී/9/11/04/2021 යටතේ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ ලේකම් වෙනුවට ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්. ආර්.එච්.ඊ.එස්. හෙට්ටිආරච්චි මහතාගේ අත්සනින් යුතුව ලබාදී ඇත. එයට අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සහකාර පොලිස් අධිකාරී තනතුරු 156ක් සඳහා පැවති අනුමත තනතුර සංඛ්‍යාව තුළින් ඇබෑර්තු වී පැවති තනතුරු පිරවීමට ජ්‍යෙෂ්ඨතාවය සහ කුසලතාවය පදනම් කරගෙන පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයේදී නියමිත ලකුණු ලබාගත් සුදුස්සන් 2021.03.18 දින සිට බලපැවැත්වෙන පරිදි සහකාර පොලිස් අධිකාරී තනතුරට උසස් කරනු ලැබූ බවට ඉන් 27 දෙනෙකු නියමිත ලකුණු ලබාගත් එහෙත් පවතින විනය ක්‍රියාමාර්ග වලට යටත්ව ඉදිරියේදී සුදුස්සන් හට ලබාදීම සඳහා පොරොත්තු ලේඛනයේ තැබූ බව දක්වා ඇත. එමෙන්ම 34 දෙනෙකු එදින සිට බලපැවැත්වෙන පරිදි අධි සේවක පදනම මත පත් කරන ලද බව ද අධිසේවක පදනම මත යටත් 08 දෙනෙකු පවතින විනය නියෝග වල තීරණ වලට අනුව උසස් කිරීම සඳහා පොරොත්තු ලේඛනයේ තැබූ බව ද දක්වා ඇත. එමෙන්ම පැමිණිලිකරු මෙම සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු 65.63ක් ලබාගත් බව ද මෙම සම්මුඛ පරීක්ෂණයේ කඩඉම් ලකුණ වන්නේ 47.34ක් බව ද වාර්තා කර ඇත. කෙසේ වෙතත් පැමිණිලිකරුට හිමි උසස්වීම ඔහු වෙනුවෙන් වෙන් කර තබා පැමිණිලිකරු පොරොත්තු ලේඛනයට ඇතුළත් කර තිබුණේ ඔහුට එරෙහිව තිබූ විනය පරීක්ෂණ ක්‍රියාවලිය හේතුවෙන් බව ද දක්වා ඇත. තවද පැමිණිලිකරු පැවති චෝදනාවෙන් නිදොස් කොට නිදහස් කර තිබූ බව පසුව පොලිස්පති විසින් 2021.11.15 දින දන්වා ඇත. එසේම ජාතික පොලිස් කොමිෂන් සභාව පැමිණිලිකරුට එක් වැටුප් වර්ධකයක් විලම්භනය කරමින් තවත් විනය චෝදනාවක් සම්බන්ධව පැවති විමර්ශනයක් අවසානයේ දී නියම කර ඇති බවද දක්වා ඇත.

පැමිණිලිකරුගේ මූලික සුදුසුකම සලකා බලා රාජ්‍ය සේවා කොමිෂන් සභාව අයදුම්පත අනුමත කර තිබුණද පසුව අනාවරණය වී ඇත්තේ වැටුප් වර්ධකයක් විලම්භනය කර තිබීම ආයතන සංග්‍රහයේ II වන බාණ්ඩයේ XLViii පරිච්ඡේදයේ 24:3:10 අනුව එය ආයතන සංග්‍රහයේ 1 වන උපලේඛනයට අදාළ වරදක් ලෙස සළකා බැලෙන බවය. ඒ අනුව 2015.04.28 දින එකී වරදට වරදකරු කර ඇති

බව ද රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති 186(II) අනුව යම් හේතුවක් මත යම් නිලධාරියෙකු හට වැටුප් වර්ධකය නියමිත වසර තුළ ලබා නොදෙන්නේ නම් හෝ නවතා තිබේ නම් පළමු උපලේඛනයේ සඳහන් වරදකට නිලධාරියෙකු දඩුවම් ලබා තිබේනම් එකී දඩුවම නියම කළ දිනයේ සිට වසර 03ක් යනතුරු ඔහුගේ සතුටුදායක සේවා කාලය ලෙස සලකා නොබැලියයුතු බවය. ඒ අනුව පැමිණිලිකරුගේ සේවා කාලය 2015.04.28 දින සිට 2018.04.30 දක්වා සතුටුදායක සේවා කාලය ලෙස සලකා බැලියහැකි බවය. ඒ අනුව 2018.04.28 සිට 2020.11.20 දක්වා පමණක් සතුටුදායක සේවා කාලය සලකා බැලීමේදී වසර 03ක සේවා කාලයක් නොතිබීමේ හේතුව මත පැමිණිලිකරු සහකාර පොලිස් අධිකාරී තනතුරට ලබා තිබූ සුදුසුකම සලකා බැලිය නොහැකි බැවින් ඉන් ඔහු ඉවත් කර ඇති බව වාර්තා කර තිබේ. තවද පැමිණිලිකරු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණයට එරෙහිව රාජ්‍ය පරිපාලන විනිශ්චය අධිකාරියට කරන ලද අභියාචනක් පවතින බව ද දක්වා ඇත.

**නිරීක්ෂණ හා නිගමන :-**

පැමිණිලිකරු සහ වගඋත්තරකරුවන් විසින් ඉදිරිපත් කර ඇති ලේඛන අනුව සකස් කරන ලද ඉහත කී කරුණු වාර්තා කිරීම් වලට අනුව විසඳියයුතු කාරණාවක් වන්නේ පැමිණිලිකරු වගඋත්තරකරුවන් විසින් පෙන්වා දී ඇති රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 186(II) අනුව හෝ ආයතන සංග්‍රහයේ XLViii 24:3:10 හි සඳහන් නීති ප්‍රකාරව සහකාර පොලිස් අධිකාරී තනතුරට සුදුසුකම් ලාභියෙකු ලෙස ද සැළකිය නොහැකි අයෙකු ද යන්න සොයා බැලියයුතු බවය.

මෙහිදී පෙනී යන කාරණාවක් වන්නේ, අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය ලෙස සැළකිය හැක්කේ 2021.09.02 වන අතර, ඉන් පෙර තිබූ අයදුම්පත් කැඳවීමේ දින අවස්ථා කිහිපයකදී සංශෝධනයකට ලක්ව තිබී ඇත. ඒ අනුව අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය 2021.09.02 දින බව නිරීක්ෂණය වේ. ඒ අනුව සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදී එකී දිනය පදනම් කර නොගෙන රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් එය 2020.11.20 දින පාදක කරගෙන ගණනය කර ඇති බව පෙනී යයි. එමෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් එවා ඇති වාර්තාවේ අයදුම්කරු සතුව තිබියයුතු සුදුසුකම් පිළිබඳව දක්වා ඇති වාර්තාවේ 2 වන පිටුවේ ABCDE ලෙස එය වෙන් කර දක්වා ඇතත් එහි ඇති කරුණුවලට අමතරව තවත් අමතර සුදුසුකමක් වන අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනයට පෙර සම්පූර්ණ කළයුතු බව දක්වා ඇත. නමුත් එය රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාල වාර්තාවේ දක්වා නැත. ඒ අනුව අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය පිළිබඳව ගැටළු සහගත තත්ත්වයක් මෙහිදී පැනනැගී ඇති බව නිරීක්ෂණය වේ. අයදුම්පත් කැඳවීමේ දිනය අවසාන වශයෙන් 2021.03.15 දින දක්වා දීර්ඝ කළ බව පොලිස්පති පණිවිඩ ආර්පීඑම් 557 අනුව වාර්තා වී ඇත. එහි මූලික සුදුසුකම් යටතේ 2020.11.20 දිනට ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරේ සක්‍රීය සේවා කාලයක් සපුරාලියයුතු බවට දක්වා ඇතත්, එහි වැඩිදුරටත් දක්වා ඇත්තේ අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට පෙර සුදුසුකම් සම්පූර්ණ කළයුතු බවය. ඒ අනුව

පොලිස්පතිගේ පණිවිඩ ආර්පීඑම් 209 අනුව දක්වා ඇත්තේ ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරේ සිට සහකාර පොලිස් අධිකාරී තනතුරට උසස් කිරීමට තෝරා ගත් ලැයිස්තුවේ පොරොත්තු ලේඛනයේ පැමිණිලිකරු තෝරා පත් කර තිබී ඇති බවය. ඒ අනුව පොලිස්පතිගේ 2021.10.29 දිනැති අංක :පීඑච්ක්ව්/ජඩී/23/07-27 අනුව පැමිණිලිකරු නිවැරදිකරු ලෙසට තීරණය කර තිබී ඇති බව ද නිදොස්කොට නිදහස් කර ඇති බව ද තීරණය කර එතෙක් රඳවා තබාගෙන ඇති වැටුප් හා දීමනා ගෙවියයුතු බවට ද තීරණය කර ඇති බව නිරීක්ෂණය වේ.

ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.02.04 දිනැතිව තම අංක :පීඑස්සී/ජීපීපී/ආර්ටීඅයි/06/2021 දරණ වාර්තාව අනුව පැමිණිලිකරු මෙම තනතුරට උසස්වීමට සුදුසුකම් නොලබන බවට දක්වා ඇති ලිපිය ප්‍රකාරව පැමිණිලිකරුගේ තුන් අවුරුදු කාලය ගණනය කර ඇත්තේ 2021.09.02 වන දින නොසලකා හරිමින් බව නිරීක්ෂණය වේ.

ඒ අනුව පැමිණිලිකරු පොරොත්තු ලේඛන ගතව තිබූ උසස්වීම පොරොත්තු ලේඛනයෙන් ඉවත් කර 2021.03.18 දින සිට ක්‍රියාත්මක වන පරිදි සහකාර පොලිස් අධිකාරී තනතුරට උසස් කිරීමට පොලිස්පති සී.ඩී. වික්‍රමරත්න මහතා විසින් 2021.11.15 දිනැතිව තම අංක ඩීඅයිජී/එච්ආර්එම්/ඔඩබ්/1378/21 යටතේ ගෙන ඇති තීරණය නිවැරදි බව නිරීක්ෂණය වේ. මේ අනුව. 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය වන ලෙස වගඋත්තරකරුවන් විසින් කටයුතු කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය** =:

මේ අනුව. 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය වන ලෙස වගඋත්තරකරුවන් කටයුතු කර ඇති බව පෙනී යන බැවින්. ඒ අනුව පැමිණිලිකරු තවදුරටත් දිගින් දිගටම මූලික අයිතිවාසිකම් කඩවීමේ තත්ත්වයකට පත් වෙමින් තිබීම වැළැක්වීම සඳහා පොලිස්පති විසින් 2021.11.15 දින තම අංක ඩීඅයිජී/එච්ආර්එම්/ඔඩබ්/1378/21 ප්‍රකාරව ගෙන ඇති නිර්දේශය පරිදි කටයුතු කළයුතු බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

ඒ අනුව පැමිණිලිකරුට හිමිවියයුතු උසස්වීම නියමිත දින සිට ලබාදීමට පියවර ගෙන ඒ අනුව ඔහුට හිමිවියයුතු සියළු හිග වැටුප් සියළු දීමනා හා හිමිවියයුතු වරප්‍රසාද ද ලබාදීමට පියවර ගැනීමට කටයුතු කළයුතු බව නිර්දේශ කරනු ලැබේ.

2023.02.28 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්.
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ම.හේ නිමල් කරුණාසිරි.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :-

01. අමාත්‍යතුමා,
මහජන ආරක්ෂක අමාත්‍යංශය,
14 වන මහල,
සුහුරුපාය, බත්තරමුල්ල.

02. සභාපති
ජාතික පොලිස් කොමිෂන් සභාව
බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව
කොළඹ 07.
- නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා

03. පොලිස්පති
පොලිස් මූලස්ථානය
කොළඹ.